

කාර්ය සාධන වාර්තාව
செயல் திறன் அறிக்கை
PERFORMANCE REPORT
2021

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
இலங்கை புகையிரத திணைக்களம்
SRI LANKA RAILWAY DEPARTMENT



කාර්ය සාධන වාර්තාව - 2021

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

පටුන

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම 1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 2
1.3 ප්‍රධාන කාර්යයන් 3
1.4 සංවිධාන සටහන 4
1.5 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක හා මාර්ග ජාලය 6
1.6 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් 7
1.7 විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 8

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි දැක්ම 9

03 පරිච්ඡේදය - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3. 1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 19
3. 2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය 21
3. 3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 23
3. 4 මූල්‍ය ප්‍රකාශ සටහන 25
3. 5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 25
3. 6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 25
3. 7 මු. රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 25
3. 8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 26
3. 9 විගනකාධිපතිවරයාගේ වාර්තාව 32

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4. 1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 27

05 පරිච්ඡේදය- තිරසාර සංවර්ධන අරමුණු (SDG) පසුරා ගැනීමේ කාර්ය සාධනය

5. 1හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න 27
5. 2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න 28

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6. 1සේවක සංඛ්‍යා කළමනාකරණය
6. 2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාඇති ආකාරය 29
6. 3 මානව සම්පත් සංවර්ධනය 30

07 පරිච්ඡේදය -අනුකූලතා වාර්තාව 31

01 පරිච්ඡේදය

1.1 හැඳින්වීම

ශ්‍රී ලාංකීය ප්‍රවාහන පද්ධතියේ පුරෝගාමී මෙහෙවරක් සිදු කරන ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව 1864 දෙසැම්බර් 26 වන දින තම ප්‍රථම මංගල ගමන සනිටුවහන් කිරීමෙන් ආරම්භ කරන ලද තම මෙහෙවර වසර 158 ක් පුරාවට සිදු කරමින් පවතී.

ප්‍රධාන ප්‍රවාහන සැපයුම් මාධ්‍යයක් ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2021 වර්ෂයේදී ආර්ථික වර්ධනය සඳහා දායකත්වයක් දක්වමින් තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. 2021 වර්ෂයේදී මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු වල අඛණ්ඩ මෙහෙවරක යෙදෙමින් පරිසර හිතකාමී හා පිරිමැසුම්දායී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු කාර්යක්ෂමව ලබා දීමට කටයුතු කරයි.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව රජයේ ප්‍රධාන දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රවාහන හා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව දුම්රිය ආඥා පනතේ ඇති විධිවිධානයන්ට යටත්ව කටයුතු ක්‍රියාත්මක කරනු ලබන අතර දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ශාඛා හා ඒකක 14 ක් යටතේ පරිපාලන කටයුතු විමධ්‍යගතවී තිබෙන අතර අදාල උප දෙපාර්තමේන්තුවේ, ශාඛාවේ, ඒකකයේ ප්‍රධානියා විසින් පැවරී ඇති කාර්යයන් ක්‍රියාත්මක කරනු බලයි.

රටේ සමස්ථ දිස්ත්‍රික්ක 25 න් දිස්ත්‍රික්ක 21 ක් ආවරණය වන පරිදි මාර්ග කිලෝමීටර් 1,478.52 දිගු දුරකින් යුතුව සමස්ථ දුම්රිය ස්ථාන 418 සමග මගී ජනතාවගේ ප්‍රවාහන පහසුකම් සැපයීම සිදු කරනු ලබයි. තම මුඛ්‍ය පරමාර්ථය වූ මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා ආරක්ෂිත, විශ්වාසදායි, නියමිත වේලාවට ධාවනය වන සකසුරුවම් හා කාර්යක්ෂම දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම හා පරිසර හිතකාමී හා පිරිමැසුම්දායී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස තම සේවා කටයුතු වඩා කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට ඉහළ කැපවීමකින් කටයුතු කරනු ලැබීය. 2021 වර්ෂයේදී ද විවිධ බාධක හා අභියෝගයන් මධ්‍යයේ වුවද තම සේවා කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යෑමට හැකි විය.

ලොවම වෙලාගත් කොරෝනා වසංගත තත්වයේ බලපෑම ශ්‍රී ලංකාව තුලද දක්නට ලැබුණු අතර 2021 මැයි මස සිට ඔක්තෝබර් දක්වා මාස පහක කාලයක් පුරාවට කොවිඩ් වසංගතය හේතුවෙන් පළාත් සංචරණ සීමා හා ඇදිරිනීතිය දැමීම ආදිය සිදු කරන ලදී. එම කාලයන් හිදී සීමා සහිත තත්වයන් යටතේ දුම්රිය ධාවනය වූ අතර ඉතා සීමිත දුම්රිය වාර සංඛ්‍යාවක් පමණක් ධාවනයට එක් කරන ලදී. එමෙන්ම වඩා සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයන්ට අනුව මගී ප්‍රවාහනය සිදු කරනු ලැබූ හෙයින් දුම්රියේ ගමන් කරනු ලැබූ මගී ප්‍රමාණයද ඉතා සීමාසහිත විය. මෙම කොරෝනා තත්වය 2021 වසරේ මගී ප්‍රමාණය හා දුම්රිය ආදායම අඩුවී තිබීම සඳහා ප්‍රධාන සාධකයක් විය.

මෙවැනි විවිධ බාධක හමුවේ වුවද මගී ජනතාව සඳහා කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් ලබාදීම සඳහා ක්‍රියාමාර්ග රාශියක් ගනු ලැබීය. ඒ අනුව චීනයෙන් හා ඉන්දියාවෙන් ආනයනය කරන ලද නවීන දුම්රියන් දුර ගමන් සේවා සඳහා යෙදවීම, නව දුම්රියන් හඳුන්වාදීම ආදිය මගින් මගී ජනතාවගේ ප්‍රවාහන අවශ්‍යතාවය සපුරා ගැනීමට ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යුහුසුළුව කටයුතු කරන ලදී.

දැක්ම

ශ්‍රී ලංකාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහනයේ
වඩාත් විශ්වසනීය
ප්‍රවාහන සැපයුම්කරු බවට පත්වීම

මෙහෙවර

මගී හා භාණ්ඩ ප්‍රවාහනය සඳහා
ආරක්ෂිත, විශ්වාසදායි
හා කාර්යක්ෂම
දුම්රිය ප්‍රවාහන සේවාවක් සැපයීම


අරමුණු

- දුම්රිය මගී හා භාණ්ඩ ප්‍රවාහන අංශයන්හි දායකත්වය වර්ධනය කිරීම
- දුම්රිය මෙහෙයුම් වල ආරක්ෂාව තහවුරු කිරීම
- මගී දුම්රිය සේවාවන්හි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම
- දුම්රිය කාර්ය මණ්ඩලයේ හා සම්පත් භාවිතයේ ඵලදායීබව වර්ධනය කිරීම
- දුම්රිය ආදායම වැඩි කිරීම
- මානව සම්පත සංවර්ධනය කිරීම
- දුම්රිය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- මගී ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක කිරීම
- භාණ්ඩ ප්‍රවාහනය සිදු කිරීම
- විශේෂ මගී දුම්රිය සේවා ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන ව්‍යුහය


GENARAL MANAGER RAILWAY
A.G.M. (A)
A.G.M. (M)
A.G.M. (T)
A.G.M. (I)
A.G.M. (O)
C.F.O
DGM
DGM(T)
CEMO
CEM
CE(W)
CE(S)
DGM C
DGMT
DGMP
D/(A)
DCET
DEMO
DEM
DEME
DEW
DEBR
DEBU
DES
SC
ST
DEC P&P
CA
CIA
DIT
SRP
SP
DSRP
D P
LGD
ADA
ET
EM
ATM
ATE
EM
EE
EM
CM
EW
S
ES
EP
AC
AST
MAR
SES
SEP
SS
SEW
SEM
SEME
SE P&P
E P&P
AC
ADE
ADSP
ASP
ADP

Level 1 **G. M. R** –General Manager railway

Level 2 **AGM(A)** – Addl. General Manager(Admin), **AGM(M)** - Addl. General Manager(Mechanical), **A. G. M. (M)** -
Addl. General Manager(Infrastructure), **A**. **G. M. (O**)- Addl. General Manager(Operation),
C. F. O – Chief Finance officer

Level 3 **DGM**-Deputy General Manager (Admin), **DGM(T**) - Deputy General Manager (Training & HR),
CEM – Chief Engineer (Motive Power), **CME**- Chief Mechanical Engineer,
CE(W) Chief Engineer (Way & works), **CSTE-** Chief Engineer (Signal & Telecommunication), ,
DGM(C) - Deputy General Manager (Commercial), **DGMT**- Deputy General Manager (Transport),
CIA- Chief Internal Auditor, **CA**- Chief Accountant, SRP- Superintendent(RP),
DGMP - Deputy General Manager (Procurement), **D P** – Director (Planning)

Level 4 **D(A)**-Director (Admin), **DCET** - Deputy Chief Engineer (Training & HRB), **DEMO** - Deputy Chief Engineer (Motive Power), **DEM**- Deputy Chief Engineer (Mechanical), **DEME** - Deputy Chief Engineer (Electrical), **DEW** - Deputy Chief Engineer (Way & Works), **DEBR** - Deputy Chief Engineer (Way & Bridges), **DEBU** - Deputy Chief Engineer (Property Development &Building), **DES** - Deputy Chief Engineer (Signal & Telecommunication), **SC** – Superintendent Commercial, **ST** – Superintendent Transportation

Level 5 **SEM** – SuperintendentEngineer(Motive Power), **SEME**- SuperintendentEngineer(Mechanical), **SEW** - SuperintendentEngineer(Way & works), **SS** – Surveyor Superintendent, **SES** - SuperintendentEngineer(Signal & Telecommunication), **SEP** -SuperintendentEngineer (Planning Project), **DSSM** – DeputySuperintendent (Sales & Marketing), **DIT** - DeputyDirector (Information Technology), **DSRP** - DeputySuperintendent (R. P), **SP** – Superintendent (Procurement)

Level 6 **ADA** – Assistant Director (Admin) / Deputy Director (Admin), **LGO** – Legal Officer, **ET** – Engineer (Training & HRB), **EM** – Engineer (Motive Power), **ATM** – Asst. Transportation Superintendent (Mechanical), **ATE** -Asst. Transportation Superintendent (Energy Conservation), **EM** – Engineer (Mechanical), **EE**– Engineer (Electrical), **CM** – Chemist & Methodologist, **EW** – Engineer (Way & Works), **S** – Surveyor, **ES** – Engineer (Signaling & Telecommunication), **EP** – Engineer (Planning & Project), **AC** – Asst. Director / Deputy Director (Cost), **AST**– Asst. Superintendent (Transportation / Commercial), **AC** – Accountant, **ADI** – Asst. Director (Information Technology), **ASRP**-Asst. Superintendent (R. P), **ASP**– Asst. Superintendent (Procurement), **ADP** – Asst. Director (Planning)

1.5 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක හා මාර්ග ජාලය

උප දෙපාර්තමේන්තු, අංශ හා ඒකක

#	උප දෙපාර්තමේන්තු / ඒකක	දෙපාර්තමේන්තුව / උප දෙපාර්තමේන්තු / ඒකක ප්‍රධානීන්
01	දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය	දුම්රිය සාමාන්‍යාධිකාරී
02	ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික)
03	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (මාර්ග/කර්මාන්ත)
04	ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (ධාවන බල)
05	ප්‍රධාන ඉංජිනේරු (සංඥා සහ විදුලි සංදේශ) උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන ඉංජිනේරු (සංඥා හා විදුලි සංදේශ)
06	ගණකාධිකාරි උප දෙපාර්තමේන්තුව	ප්‍රධාන මූල්‍ය නිලධාරි
07	වාණිජ උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (වාණිජ)
08	දුම්රිය ගබඩා උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ප්‍රසම්පාදන)
09	ගමනාගමන උප දෙපාර්තමේන්තුව	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(ගමනාගමන)
10	ශ්‍රී ලංකා දුම්රිය ආරක්ෂක සේවය	ආරක්ෂක අධිකාරි
11	ශ්‍රී ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පුහුණු හා මානව සම්පත්)
12	ප්‍රධාන පිරිවැය නිලධාරි කාර්යාලය	ප්‍රධාන පිරිවැය නිලධාරි
13	සැලසුම් ඒකකය	අධ්‍යක්ෂ (සැලසුම්)
14	දත්ත සැකසුම් ඒකකය	කළමනාකරු දත්ත සැකසුම්

වගු අංක 01

දුම්රිය මාර්ග ජාලය

මාර්ගය	දුර කි.මී.	දුම්රිය ස්ථාන සංඛ්‍යාව	උප දුම්රිය ස්ථාන සංඛ්‍යාව	දුම්රිය හෝල්ට්
මුහුදුබඩ මාර්ගය (කොළඹ කොටුව සිට බෙලිඅත්ත දක්වා)	186	41	33	0
ප්‍රධාන මාර්ගය (කොළඹ කොටුව සිට බදුල්ල දක්වා)	292.38	45	33	26
මාතලේ මාර්ගය (පේරාදෙනියේ සිට මාතලේ දක්වා)	33.75	06	06	12
පුත්තලම් මාර්ගය (රාගම සිට පුත්තලම දක්වා)	119.57	19	25	0
පුත්තලම අරුවක්කාලු මාර්ගය	37.00	1		
කැලණිවැලි මාර්ගය (මරදාන සිට අවිස්සාවේල්ල දක්වා)	59.27	11	19	7
වරාය මාර්ගය	7.00	1	-	-
කොලොන්නාව මාර්ගය	3.18	1	-	-
උතුරු මාර්ගය (පොල්ගහවෙල සිට කන්කසන්තුරය දක්වා)	339.47	31	26	17
තලෙමන්නාරම් මාර්ගය (මැදවච්චියේ සිට තලෙයිමන්නාරම දක්වා)	106.06	07	04	0
මිහින්තලේ මාර්ගය	13.50	01	0	2
මඩකලපු මාර්ගය (මහව සිට මඩකලපුව දක්වා)	211.11	14	17	05
ත්‍රිකුණාමල මාර්ගය (ගල්ඔය හංදියේ සිට ත්‍රිකුණාමලය දක්වා)	70.23	04	02	02
Total	**1,478.52**	**182**	**165**	**71**

වගු අංක 02

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යටතේ වෙනත් ආයතන හෝ අරමුදල් නොමැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

#	ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (ඇ.ඩො. මි.)	වර්තමාන ප්‍රගතිය
01	දුම්රිය එන්ජින් 10 (ඉන්දියානු ණය ආධාර)	42.5	මිලදී ගැනීම් අවසන් කර ඇත.
02	බලවේග කට්ටල 06 (ඉන්දියානු ණය ආධාර)	58.04	මිලදී ගැනීම් අවසන් කර ඇත.
03	මගී මැදිරි 160 (ඉන්දියානු ණය ආධාර)	86.00	2021 වසරේ මැදිරි 80ක් ලැබී ඇත.
04	වායුසමනය කරන ලද බලවේග කට්ටල 2 ක් ප්‍රසම්පාදනය කිරීම (ඉන්දියානු ණය ආධාර)	22.40	20% අත්තිකාරම් ගෙවා ඇත.
05	තෙල් ටැංකි 30 ක් කන්ටේනර් ප්ලැට් වැගන් 20 (ඉන්දියානු ණය ආධාර)	4.26	මිලදී ගැනීම් සම්පූර්ණ වී ඇත
06	උඩරට දුම්රිය මාර්ගය සඳහා බලවේග කට්ටල 09 ක් මිල දී ගැනීම (චීන ණය ආධාර)	93.86	මිලදී ගැනීම් අවසන් කර ඇත.
07	උඩරට දුම්රිය මාර්ගය සඳහා එංජින් 12 ක් මිල දී ගැනීම (ඇමරිකාව)	42.50	කැබිනට් අනුමැතිය ලැබී ඇත.

වගු අංක 03

02 පරිජ්ඡේදය

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්ම..... .

රටක ප්‍රවාහන පද්ධතිය යනු එම රටේ ජීවනාලිය බදු වුවකි. ප්‍රවාහනයෙන් තොරව රටක සංවර්ධනය පිළිබඳව සිතිම පවා ඉතා අපහසු කරුණකි. ඒතුල දුම්රිය ප්‍රවාහනයට හිමිව ඇත්තේ සුවිශේෂී ස්ථානයකි. මගී ජනතාව සඳහා කාර්යක්ෂම, ආරක්ෂාකාරී, සකසුරුවම් හා පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය ප්‍රවාහනය වැදගත් කමක් උසුලනු ලබයි. ශ්‍රී ලංකාවේ මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා දායකත්වය ලබා දෙන ප්‍රධාන ප්‍රවාහන පාර්ශව කරුවකු ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය ප්‍රවාහන සේවා කටයතු වල නියැලෙමින් සිටී. වර්තමානයේ මගී ප්‍රවාහන කටයුතු සඳහා වැඩි නැඹුරුතාවයකින් කටයුතු කරන ශ්‍රී ලංකා දුම්රිය සේවය කාර්යාල සේවා, දුර ගමන් සේවා, නගරාන්තර දුම්රිය සේවා හා විශේෂ සංචාරක හා ආගමික කටයුතු සඳහා ක්‍රියාත්මක වන විශේෂ දුම්රිය සේවා පවත්වාගෙන යනු ලබයි. ශ්‍රී ලංකා ආර්ථිකයේ දළ දේශීය නිෂ්පාදිතයේ සේවා අංශයේ වෘද්ධිය සඳහා දායකත්වය ලබා දෙමින්, විවිධ අභියෝගයන් හා ගැටළු හමුවේ වුවද, වඩා කාර්යක්ෂම දුම්රිය සේවයක් සැපයීම වෙනුවෙන් අඛණ්ඩ ප්‍රයත්නයක නියැලි සිටී. එමෙන්ම රජයේ ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව දුම්රිය දෙපාර්තමේන්තුව සිය කාර්යසාධන ඉලක්ක සපුරා ගැනිමට ඉහල ප්‍රමුඛත්වයක් ලබාදී ඇත.

2021 වර්ෂයේ දෙවන හා තෙවන කාර්තුවේ සිට ඉස්මතු වූ කෝවිඩ් වසංගත තත්වය හමුවේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සියළු දුම්රිය මෙහෙයුම් කටයුතු වලට හා දෛනික ක්‍රියාකාරකම් සඳහා දැඩි බලපෑමක් සිදුවිය. කෙසේ වුවද එම අභියෝගය හා ගැටළු හමුවේ මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු සඳහා උපරිම දායකත්වයක් ලබාදෙමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය අඛණ්ඩ මෙහෙවරක යෙදුණි. සාමාන්‍ය තත්වය යටතේ දෛනිකව දුම්රිය ගමන් වාර 390 ක් හා එමඟින් දුම්රිය මඟීන් ලක්ෂ 4 කට ආසන්න ප්‍රමාණයක මෙහෙයුම් කටයුතු සිදු කරනු ලබන අතර භාණ්ඩ දුම්රිය ගමන් වාර 03 ක් ද තෙල් දුම්රිය ගමන් වාර 08 ක් ද මෙහෙයුම් කටයුතු සිදු කරනු ලැබීය. 2020 වර්ෂයට සාපේක්ෂව දුම්රිය ගමන්වාර 41% ක අඩුවීමක් පෙන්නුම් කරන අතර එයට බලපාන ලද ප්‍රධාන හේතු සාධකය වුයේ රටේ පැවති කොරෝනා තත්වය හේතුවෙන් දුම්රිය ගමන්වාර කිහිපයක් අවලංගු කිරීමයි.

ඉන්දිය ණය පහසුකම් මත මගී මැදිරි 160 ක් මිලදී ගැනීමේ ව්‍යාපෘතියෙන් මගී මැදිරි 120 ක් 2021 වසර අවසන් වන විට පැමිණ ඇත. 2021 වසරේ දුම්රිය සේවයේ දියුණුව හා මගී ජනතාවගේ ගමන් පහසුව සඳහා ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රධාන දුම්රිය සංවර්ධන ව්‍යාපෘතීන් වේ. තවද ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර යටතේ කොළඹ තදාසන්න දුම්රිය සේවය වැඩි දියුණු කිරිම සඳහා ශක්‍යතා අධ්‍යනයක් සිදුකර එම ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කර තිබෙන අතර දුම්රිය සේවයේ අභිවෘද්ධිය සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීමද (Railway Master Plan) ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර යටතේ ක්‍රියාත්මක වේ.

තවද, මගී හා භාණ්ඩ, දුම්රිය මගින් ප්‍රවාහනය කිරීමේ කටයුතු වල ගුණාත්මකභාවය තවදුරටත් වර්ධනය කිරීම සඳහා මහව සිට ඕමන්ත දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපන කටයුතු ක්‍රියාත්මක කිරීම, ආදී කටයුතු දුම්රිය සංවර්ධනය සඳහා 2021 වසර තුළ ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති වේ.

තවද මුහුදුබඩ දුම්රිය මාර්ගයේ දකුණු පයාගල සිට අළුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගයේ මූලික කටයුතු ආරම්භ කිරීම හා පුත්තලම දුම්රිය මාර්ගයේ කටුනායක හා මීගමුව අතර ද්විත්ව දුම්රිය මාර්ගයේ වැඩ කටයුතු සිදු කරමින් පවතී.

ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ පවතින අභියෝග ජයගනිමින් තිරසාර සංවර්ධන සංකල්පය අනුව ගමන් කිරීම සිදු කරනු ලබයි. එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා උපරිම කැපවීමෙන් යුතුව නිවැරදි දැක්මක් යටතේ දුම්රිය දෙපාර්තමේන්තුවේ කටයුතු කරනු ලබයි. විශේෂයෙන් ඉන්දිය ණය ආධාර යටතේ හා චීන ණය ආධාර යටතේ මෙරටට ආනයනය කරන ලද සුඛෝපභෝගී දුම්රියන් මගි ජනතාවගේ ගමන් පහසුව සඳහා යොදා තිබේ. එමෙන්ම සංචාරක ප්‍රජාවන්ද ඉලක්ක කර ගනිමින් විශේෂ දුම්රියන් යොදවා තිබීම සංචාරක කර්මාන්තයේ දියුණුවටද පිටිවහක් වනු ඇත. විශේෂයෙන්ම දුම්රිය ප්‍රවාහනය ශ්‍රී ලංකාවේ ශක්තිමත් ප්‍රවාහන මාධ්‍ය බවට පත්කිරීම සඳහා හා මගී ආකර්ෂණය වැඩි කිරීම සඳහා ජනතාව ආකර්ෂණය කර ගැනීමට පර්යේෂණයන් සිදුකර අනාගත දුම්රිය වාරයන් සැළසුම් කිරීම සඳහා යොමුව ඇත. එමෙන්ම වත්මන් තත්වයට ගැලපෙන නවීන තාක්ෂණය යොදා ගනිමින් දුම්රිය ප්‍රවාහනයේ ප්‍රගතිය සඳහා කටයුතු කිරීම ඉතාමක් කාලෝචිත කාර්යයක් වේ.

2021 වර්ෂයේදී මගීන් මිලියන 35.96 ක් ගමන් කල අතර මගී කිලෝමීටර් මිලියන 2,158.16 ක දුර ප්‍රමාණයක් ධාවනය කර ඇත. එමෙන්ම භාණ්ඩ ටොන් මිලියන 1.83 ක් ප්‍රවාහනය කරමින් හා භාණ්ඩ ටොන් කිලෝමීටර් මිලියන 161.56ක් ධාවනය කරමින් ශ්‍රී ලංකා දුම්රිය සේවය සිය අඛණ්ඩ දායකත්වය ලබා දී ඇත. තවද වර්ෂයේ මුළු ආදායම 41% කින් අඩුවිමක් පෙන්නුම් කරයි.

මෙම වර්ෂයේදී වසර පුරා වරින් වර පැවති කොරෝනා තත්වය හේතුවෙන් දුම්රිය ගමන්වාර ප්‍රමාණය සීමාසහිතව සිදුකරගෙන යන ලදි. මේ නිසා නව දුම්රිය සේවා ආරම්භ කිරීම මෙන්ම සේවාවන් දීර්ඝ කිරීම සිදු නොකරන ලදී.

කොරෝනා තත්වය හමුවේ වුවද මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවා සැපයීම සඳහා දුම්රිය මාර්ගවල පවතින වේග සීමාවන් අවම කර ගනිමින් සේවක හිඟය, මූල්‍යමය ගැටළු, යටිතල පහසුකම් ආදී කරුණු සම්බන්ධයෙන් උපාය මාර්ගික විසඳුම් යොදමින් ජනතාවට වඩා විශ්වසනීය වුත්, සුවපහසු වුත් දුම්රිය සේවාවක් සැපයීම සඳහා අඛණ්ඩ මෙහෙවරක යෙදුනි.

ඉදිරි දැක්ම

වර්තමාන රජයේ ප්‍රවාහන ප්‍රතිපත්තියේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ මාර්ග තදබදය සඳහා විසඳුම් ලබාදීමයි. ඒ අනුව මහා මාර්ගයේ ගමන් ගන්නා මගීන් හා භාණ්ඩ ප්‍රවාහන කටයුතු දුම්රිය මගින් සිදු කිරීම ප්‍රධාන අභිලාශයක් වේ. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව දුම්රිය යටිතල පහසුකම් සංවර්ධනය කර ඉතා කාර්යක්ෂම හා සකසුරුවම් දුම්රිය සේවාවක් ලබාදීම දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ. ඒ අනුව දුම්රිය ඉදිරි සැළසුම් මෙම පරමාර්ථ මුල් කර ගනිමින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. මේ යටතේ වඩාත් ආකර්ෂණීය හා පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් ලෙස දුම්රිය සේවයේ පහත සඳහන් සාධනීය සංවර්ධනයන් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

- කාර්යක්ෂම හා සුවපහසු දුම්රිය සේවාවක් පවත්වාගෙන යාම
- පානදුර - කොළඹ - වේයන්ගොඩ, රාගම - කටුනායක - මිගමුව සහ මරදාන - හෝමාගම යන දුම්රිය සේවා සඳහා විදුලි දුම්රිය පද්ධතියක් හඳුන්වා දීම හා සාමාන්‍ය දුම්රිය සේවා වලට අමතරව සුඛෝපභෝගි කාර්යාලිය දුම්රිය සේවාවක් ආරම්භ කිරීම
- දුම්රිය සේවාව නවිකරණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේද සහ ඩිජිටල්කරණය හඳුන්වා දෙමින් දුම්රිය ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සහ ආසන වෙන් කිරීම සඳහා ඔන්ලයින් සේවාවක් සහ ඊ ප්‍රවේශපත්‍ර සහ ස්වයංක්‍රීය ඇතුළුවිමේ පිටවිමේ දොරටු ක්‍රමයක් හඳුන්වා දීම

- භාණ්ඩ ප්‍රවාහනය සඳහා අවශ්‍ය දුම්රිය එංජින් ආනයනය කිරීම සහ දුම්රිය තට්ටු දේශීයව ඉදිකිරීම හා කොළඹ, හම්බන්තොට, ත්‍රිකුණාමලය, කන්කසන්තුරය යන වරාය වල දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් වර්ධනය කිරීම

ඉදිරි සංවර්ධන ව්‍යාපෘති

01. මහව - ඕමන්ත දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය
02. පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
03. කුරුණෑගල සිට මහව දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම.
04. පුත්තලම දුම්රිය මාර්ගයේ මීගමුව සිට කොච්චිකඩේ දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීම
05. පැරණි කැළණි පාලම නැවත ඉදිකිරීම
06. දුම්රිය සේවය සඳහා ප්‍රධාන සැලැස්ම සකස් කිරීම
07. ඉලෙක්ට්‍රෝණික ප්‍රවේශපත්‍ර ක්‍රමයක් හඳුන්වාදීම
08. මගී මැදිරි නිෂ්පාදනය ආරම්භ කිරීම
09. නව දුම්රිය සංඥා පද්ධතියක් ස්ථාපිත කිරීම
10. ආරක්ෂිත දුම්රිය හරස්මාර්ග පද්ධතියක් ස්ථාපිත කිරීම
11. මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මැදිරි 100 ක් පුනරුත්ථාපනය කිරීම
12. දකුණු පයාගල - අළුත්ගම දක්වා දුම්රිය මාර්ගය ද්විත්වකරණය කිරීම
13. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය යටතේ කළුතර හා පොල්ගහවෙල අතර විදුලි දුම්රිය සේවා ඇරඹීම.

මූල්‍ය ප්‍රගතිය

2021 වසරේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව උපයාගත් ආදායම් හා වියදම් පිළිබඳ තොරතුරු පහත වගුවෙන් දක්වා ඇත.

#	ආදායම් කාණ්ඩය	ආදායම (රු. මි.) 2020	ආදායම (රු. මි.) 2021
01	මගී	3,481.53	1,606.84
02	පාර්සල් සහ තැපැල්	89.09	59.00
03	භාණ්ඩ හා පශු සම්පත්	364.77	431.45
04	වෙනත්	631.24	581.45
එකතුව		**4,566.64**	**2,678.72**

වගු අංක 04

වියදම් කාණ්ඩය	වියදම රු. මි
පුනරාවර්ථන වියදම	12,979.21
ප්‍රාග්ධන වියදම	27,436.85
එකතුව	**40,416.06**

වගු අංක 05

ප්‍රධාන ප්‍රවාහන සේවා සැපයුම්කරුවෙකු ලෙස ශ්‍රී ලංකා දුම්රිය සේවය 2021 වර්ෂයේදී ද මගී හා භාණ්ඩ ප්‍රවාහන කටයුතුවල නියැලෙමින් ආර්ථිකයේ දෛනික ප්‍රවාහන අවශ්‍යතා සපයමින් සිටිය අතරතුර 2021 දෙවන කාර්තුවේදී නැවතත් පැනනැගුණ කෝවිඩ් -19 වසංගත තත්වය හමුවේ දුම්රිය ප්‍රවාහනය හා සම්බන්ධ ක්‍රියාවලියට විශාල බලපෑමක් සිදුවිය. මේ තත්වය හේතුවෙන් මගී හා භාණ්ඩ ප්‍රවාහනය විශාල ලෙස පහත වැටුණු අතර මුළු අදායම, මගීන් සංඛ්‍යාව, සැලකියුතු ප්‍රමාණයකින් පහත වැටුණි.

2021 වර්ෂයේ මුළු අදායම රු. මි. 2,678.72 ක් වූ අතර එය 2020 වර්ෂයේදී එම කාලය තුල රු. මි. 4,566.64 ක් විය. ඒ අනුව මුළු ආදායමේ 41% ක අඩුවීමක් පෙන්නුම් කරයි. 2021 දෙවන කාර්තුවේ සිට නැවතත් පැනනැගුන කොරෝනා වසංගත තත්වය මෙම අඩු වීම කෙරෙහි බලපෑ ප්‍රධාන සාධකය වේ. ඒ අනුව පසුගිය වසරට සාපේක්ෂව මගී අදායම 54% කින් අඩුවී ඇති අතර භාණ්ඩ ආදායම 18% කින් වැඩිවීමක් පෙන්නුම් කරයි. භාණ්ඩ ප්‍රවාහන ආදායම වැඩිවීම කෙරෙහි ප්‍රිමා පිටි ප්‍රවාහන කටයුතු ආරම්භ කිරීම, වැලි ප්‍රවාහන කටයුතු සිදුකිරීම, සිමෙන්ති ප්‍රවාහනය සහ තෙල් ප්‍රවාහන කටයුතු ක්‍රියාත්මක කිරීම හේතු විය.

2021 වර්ෂයේ මුළු වියදම රු. මි. 40,416.06 ක් වූ අතර මේ තුළ රු. මිලියන 12,979.21ක් පුනරාවර්තන වියදම හා රු. මි. 27,436.85 ක් වූ ප්‍රාග්ධන වියදම ඇතුළත් වේ.
මෙම කාල පරිච්ඡේදය තුල පනවන ලද සංචරණ සීමා හේතුවෙන් මගී දුම්රිය ධාවනය සීමා කරනු ලැබූ අතර භාණ්ඩ හා තෙල් ප්‍රවාහන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි.

එසේම මෙම තත්වය දුම්රිය ඇණියේ අළුත්වැඩියා හා නඩත්තු කටයුතුවලට සහ දුම්රිය මාර්ග, ගොඩනැඟිලි, පාලම් සහ සංඥා පද්ධතිය යන අංශයන්හි ඉදිකිරීම් හා පුනරුත්ථාපන කටයුතු සඳහා ද විශාල ලෙස බලපෑමක් එල්ල වුණි.
කෙසේ වුවද මෙම කාලපරිච්ඡේදය තුල සේවාව කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා දුම්රිය ඇණියේ ප්‍රසම්පාදන කටයුතු අඛණ්ඩව සිදුකිරීමට පියවර ගැණුනි. ඒ අනුව, වායුසම්කරණය කරන ලද දුම්රිය බලවේග කට්ටල 02 ක් හා මගී මැදිරි 160 ක් ප්‍රසම්පාදනය සඳහා මූලික ගෙවීම් සිදුකර එම කටයුතු අඛණ්ඩව කරගෙන යනු ලැබීය.

- මහව සිට ඕමන්තෙයි දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම් ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- මගී මැදිරි 200 ක් පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මගී මැදිරි 100ක් පුනරුත්තාපනය කිරීම.
- ආසියානු සංවර්ධන බැංකුව විසින් මුල්‍යාධාර සපයන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය මගින් ශක්‍යතා අධ්‍යන කටයුතු අඛණ්ඩව සිදු කිරීම.
- දුම්රිය සේවයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කරන ලද ආයතන සමාලෝචන වැඩසටහන (Enterprise Review Programme) අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- කොවිඩ් 19 වසංගත තත්වය හමුවේ දුම්රිය ස්ථානයන්හි සනීපාරක්ෂක කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

- ලෝක බැංකු මූල්‍ය ආධාර යටතේ තෝරාගත් දුම්රිය ස්ථාන 10ක් වැඩිදියුණු කිරීම ආරම්භ කිරීම.

වාණිජ කටයුතු

ආදාල කාලපරිච්ඡේදය තුල දුම්රිය ආදායම් ඉහළ නැංවීම සදහා පහත සදහන් වාණිජ කටයුතු ක්‍රියාත්මක කරන ලදි.

1. සමුපකාර තොගවෙළඳ සංස්ථාව (ස. තො. ස) හා එක්ව පාරිභෝගිකයන්ගේ පහසුව සදහා කොළඹ කොටුව, හෝමාගම සහ පාදුක්ක දුම්රිය ස්ථාන පරිශ්‍රයන්හි ස. තො. ස (Q - Shop) ආරම්භ කිරීම.
   තවද, මෙම වසර තුල කොට්ටාව, මීගොඩ, නාරහෙන්පිට දුම්රිය ස්ථානහි Q - Shop ස්ථාපනය කිරීමට සැළසුම්කර ඇත.
2. රථගාල් (දුම්රිය පරිශ්‍ර 23ක), සුළු වෙළදසැල් (මිල්කෝ) 13ක් බඩු ගබඩා බදු දීම සදහා ටෙන්ඩර් කැඳවීම් කටයුතු ක්‍රියාත්මක කිරීම.
3. තේ මණ්ඩලය, ජාතික ලොතරැයි මණ්ඩලය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය යන ආයතන වල අළෙවිසැල් ආරම්භ කිරීමට මූලික කටයුතු සිදුකිරීම
4. සමෘද්ධි අමාත්‍යාංශය සමග සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ අත්කම් නිෂ්පාදන අළෙවිසැල් ආරම්භ කිරීමට කටයුතු කිරීම.
5. එළවළු ප්‍රවාහන කටයුතු සිදුකිරීම සදහා මූලික කටයුතු ආරම්භ කිරීම.
6. හොල්සිම් ආයකනය සමග එක්ව අරුවක්කාරු සිට බුස්ස දක්වා හුණුගල් ප්‍රවාහන කටයුතු ආරම්භ කිරීම සදහා මූලික කටයුතු සිදු කිරීම.

යටිතල පහසුකම් සංවර්ධනය

2021 වර්ෂයේ දී ද පැවති කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් දුම්රිය මාර්ග, ගොඩනැගිලි, පාලම් සහ සංඥා පද්ධතිය යන අංශයන්හි පහත ප්‍රධාන සංවර්ධන සහ නඩත්තු කටයුතු සීමා වුවද මෙම කාලපරිච්ඡේදය තුල පහත සදහන් සංවර්ධන කටයුතු අඛණ්ඩව කරන ලදි.

- දුම්රිය මාර්ගයන්හි නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකිරීම
- මහනුවර, පේරාදෙණිය සහ කඩුගන්නාව දුම්රිය මාර්ගය හා සම්බන්ධ කාර්යයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- කටුනායක සිට කොච්චිකඩේ අතර ද්විත්ව දුම්රිය මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කුරණ දක්වා නිමකිරීම.
- නව දුම්රිය ස්ථාන ගොඩනැගිලි ඉදිකිරීම, පාලම් නඩත්තු කිරීම, සහ දුම්රිය ස්ථානයන්හි සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම් අඛණ්ඩව සිදුකිරීම
- සංඥා හා විදුලි සංදේශ පද්ධතිය වැඩිදියුණු කිරීමේ සහ නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකිරීම.

- පොල්ගහවෙල සිට කුරුණෑගල දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ මූලික කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.
- දකුණු පයාගල හා අලුත්ගම දක්වා ද්විත්ව දුම්රිය මාර්ගය ඉදි කිරීමේ මූලික කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
- මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

දුම්රිය ඇණිය

කාර්යක්ෂම මගී හා භාණ්ඩ ප්‍රවාහන සේවාවක් සැපයීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවය දුම්රිය ඇණියට අඛණ්ඩ නඩත්තු හා අලුත්වැඩියා කටයුතු මෙම කාලය තුළ දී සිදුකරන ලදි. 2021 වර්ෂයේ නැවතත් පැන නැගුන කොවිඩ් 19 තත්වය හේතුවෙන් දුම්රිය ඇණියේ නඩත්තු හා අලුත්වැඩියා කටයුතු සීමා විය.

කෙසේ වුවද, ප්‍රධාන අළුත්වැඩියා කිරීම් 800 ක ප්‍රමාණයක් සහ සුළු අළුත්වැඩියා කිරීම් 26,706 ක් මෙම කාලය තුල සිදු කර ඇත. මගී මැදිරි පුනරුත්ථාපනය, බලවේග කට්ටල, එංජින්, ගැල් 04 ක් සහ රේල් බස් අලුත්වැඩියාව, එංජින් පුනරුත්ථාපනය සහ රී එංජින් කිරීම, යන්ත්‍ර සහ උපකරණ අලුත්වැඩියා සහ නඩත්තු කිරීම මෙම කාලය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. ඊට අමතරව මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලද අතර වායු සම්කරණය කරන ලද ඩිසල් බලවේග කට්ටල 02 ක් හා මගී මැදිරි 160 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා මූලික ගෙවීම් සිදු කර ඇති අතර. මේ වන විට මගී මැදිරි 160 න් 80 ක් ආනයනය කර ඇත.

මගී මැදිරි 200ක් පුනරුත්තාපනය කිරීමේ ව්‍යාපෘතියේ දිගුවක් ලෙස තවත් මගී මැදිරි 100ක පුනරුත්ථාපන කටයුතු ආරම්භ කර ඇති අතර ඉන් දැනට මගී මැදිරි 30 ක් අවසන් කර ඇත.

මගී හා භාණ්ඩ ප්‍රවාහනය

2020 වර්ෂයේ මගීන් මිලියන 65. 08 ක් දුම්රියෙන් ගමන් කරන ලද අතර 2021 වර්ෂයේදී මගීන් 35.96 ගමන් කර ඇත. එය 2020 වර්ෂයට සාපේක්ෂව 45 % ක අඩු වීමක් දක්වයි. මෙලෙස මගීන් ගේ අඩුවීම සඳහා ප්‍රධාන ලෙසම බලපාන ලද කරුණු වුයේ 2021 වසර තුළ වරින් වර පැවති කෝවිඩ් තත්වය හේතුවෙන් සංචරණ සීමා පැනවීම සේවයට වාර්තාකිරීම සීමා කිරීම තුළ දුම්රිය ධාවන වාර ප්‍රමාණයන්ද සීමා සහිත තත්වයක් තුළ සිදු කරන ලදී.

ගමන්කළ මගී සංඛ්‍යාව හා මගී ආදායම

වර්ෂය	ගමන්කළ මගීන් සංඛ්‍යාව (මි)	මගී ආදායම රු. (මි)	මගී කි. මී (මි)
2020	65.08	3,481.53	3,905.55
2021	35.96	1,606.83	2,158.16

වගු අංක 06

භාණ්ඩ ආදායම හා ප්‍රවාහනය කරන ලද භාණ්ඩ ප්‍රමාණය

වර්ෂය	භාණ්ඩ ආදායම රු. (මි)	භාණ්ඩ ප්‍රමාණය (ටොන් මි.)	ටොන් කිලෝමීටර් ප්‍රමාණය (මි)
2020	364.77	1.78	114.37
2021	431.45	1.83	161.56

වගු අංක 07

- 2021 වර්ෂයේ භාණ්ඩ ප්‍රවාහන කටයුතු පිළිබඳව සැලකීමේදී භාණ්ඩ ප්‍රවාහන ආදායම 18.28 % ක්ද භාණ්ඩ ටොන් ප්‍රමාණය 2.80 % ක් හා ටොන් කිලෝමීටර් ප්‍රමාණය 1.92 % ප්‍රමාණයකින්ද වැඩිවීමක් පෙන්නුම් කරයි. කෝවිඩ් තත්වය හමුවේ වුවද තෙල් ප්‍රවාහන කටයුතු අඛණ්ඩව සිදුකිරීම මෙයට ඉවහල් විය.

මෙහෙයුම් දර්ශකය

අංකය	කාර්ය සාධන දර්ශකය	2020	2021
01	දුම්රිය ආදායම (රු. මි.)	4,566.64	2,678.74
04	ගමන් කළ මගී සංඛ්‍යාව (මිලියන)	65.08	35.96
03	මගී කි. මී. ප්‍රමාණය (මිලියන)	3,905.55	2,158.16
04	ප්‍රවාහනය කළ භාණ්ඩ ටොන් ප්‍රමාණය (මිලියන)	1.78	1.83
05	භාණ්ඩ ටොන් කි. මී. (මිලියන)	114.37	161.56

වගු අංක 08

සමස්ථ දුම්රිය ධාවනය

දුම්රිය සේවය	සැලසුම් කළ දුම්රිය සංඛ්‍යාව	ධාවනය වූ දුම්රිය සංඛ්‍යාව
තදාසන්න	45,095	39,209
ප්‍රාදේශීය	17,356	13,993
දුරස්ථ හා නගරාන්තර	12,118	9,014
රේල් බස්	1,694	1,471
i මගී	**76, 263**	**63,687**
ii භාණ්ඩ	**7, 961**	**5,349**
එකතුව	**84,224**	**69,036**

වගු අංක 09

ඉහත වගු අංක 09හි දැක්වෙන තොරතුරු අනුව 2021 වසර තුළ ධාවනය සඳහා සැලසුම් කළ මගී දුම්රිය සංඛ්‍යාව **76, 263**ක් වූ අතර එයින් **63,687**ක් ධාවනය කර ඇත. එය ප්‍රතිශතයක් ලෙස ගත් විට 83 % කි. මගී හා භාණ්ඩ දුම්රිය ධාවන කටයුතු අඩුවීමට කෝවිඩ් ව්‍යාප්තිය හේතුවෙන් ඇදිරිනීතිය දැමීම හා සංචරන සීමා පාලනය කිරීමයි. එම තත්වයන් අනුව දුම්රිය ගමන්වාර සීමා කිරීමත් සෘජුවම බලපාන ලදී.

ස්ථිර මාර්ග පද්ධතිය හා ගොඩනැගිලි

ස්ථිර මාර්ග පද්ධතියේ නඩත්තු කටයුතු හා වැඩිදියුණු කිරීම් අඛණ්ඩව ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා රේල් පිලි මීටර් 180, 607ක් ද කොන්ක්‍රීට් සිල්පර 58,597 ක්ද දැව සිල්පර 50,923 ක්ද බැලස්ට් කියුබ් 19,223 ක් ද භාවිතා කෙරිණි.

දුම්රිය මාර්ග නඩත්තුව සඳහා උපයෝගී කර ගත් ද්‍රව්‍ය

යොදා ගත් ද්‍රව්‍ය	ප්‍රමාණය
රේල් පිලි (මීටර්)	180,607
දැව සිල්පර	50,923
වානේ සිල්පර	392
කොන්ක්‍රීට් සිල්පර	58,597
බැලස්ට් කියුබ්	19,223

වගු අංක 10

සංඥා හා විදුලි සංදේශ පද්ධතිය

සංඥා පද්ධතියේ අඛණ්ඩව නඩත්තු කටයුතු සහ වැඩිදියුණු කිරීම කාර්යක්ෂම දුම්රිය සේවයක් ලබා දීම කෙරෙහි වැදගත් සාධකයක් වේ. 2021 වසරේ ද සංඥා පද්ධතියේ වැඩිදියුණු කිරීම් හා නඩත්තු කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කරමින් පහත සඳහන් කාර්යන් ක්‍රියාත්මක කරනු ලැබේ.

1. කුරණ සිට මීගමුව ද්විත්ව දුම්රිය මාර්ගයේ නව සංඥා පද්ධතිය 60% ක් වැඩ අවසන් කිරීම
2. වනවාසල නව අපද්‍රව්‍ය කළමණාකරණ මධ්‍යස්ථානය වෙත නව සංඥා පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය 50% ක් අවසන් කිරීම.
3. දුම්රිය ආරක්ෂිත හරස් මාර්ග (Bell & Light) පද්ධති 2ක් ස්ථාපිත කිරීම
4. විදුලි සීනු හා ආලෝක ආරක්ෂිත පද්ධති 10 ක් ස්ථාපිත කිරීම
5. වැල්ලව දුම්රිය ස්ථානයේ නව සංඥා පද්ධතිය 80% ක් නිම කිරීම
6. සංඥා ස්ථාන (Points) 75ක් නවීකරණය කිරීම.

අභියෝග හා ගැටලු

1. මගී හා භාණ්ඩ ප්‍රවාහනයට අවශ්‍ය යටිතල පහසුකම් හි පවතින අඩු ධාරිතාව.
2. සමස්ත දුම්රිය මාර්ග ජාලයේ පවතින අනාරක්ෂිත දුම්රිය හරස් මාර්ග සංඛ්‍යාව ඉහළ අගයක් ගැනීම
3. ප්‍රමාණවත් නොවන දඩමුදල් අයකිරීම
4. පැරණි එංජින් ප්‍රමාණය
5. පුහුණු ශ්‍රම හිඟය

දෛනික සේවා පවත්වා ගෙන යෑමේදී සියලුම අංශවල පවතින කාර්ය මණ්ඩල හිඟය නිසා අදාල කටයුතුවලදී ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වේ.

පුනරාවර්තන වියදම ඉහළ යෑම

පුනරාවර්තන වියදම්වලට ඇතුළත් වන පුද්ගල පඩිනඩිවල හා ඉන්ධන වියදම් ඉහළ මට්ටමක පවතින නිසා ආදායම හා පුනරාවර්තන වියදම අතර ඇති අවාසිදායක මූල්‍ය පරතරය අඛණ්ඩව දක්නට ලැබේ.

1. ප්‍රමාණවත් නොවන දුම්රිය ඇණිය හා යටිතල පහසුකම් හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුව තම සේවා කාර්යක්ෂමව සැපයීමේ ගැටළුකාරී තත්වයට මුහුණ දී තිබේ.
2. සංඥා හා විදුලි සංදේශ පද්ධතිය ඉතා පැරණි වීම.
3. දුම්රිය රක්ෂිතයන්හි අනවසර පදිංචිකරුවන්.
4. පුහුණු හා සංවර්ධනයන කටයුතු අවම වීම.
5. ඉඩම් කළමනාකරණය, මෙහෙයුම් කළමනාකරණය, තොග පාලනය, මානව සම්පත් කළමනාකරණය, නඩත්තු කටයුතු ආදි අංශවල තොරතුරු තාක්ෂණය අවම වීම.

තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් වෙත මානව හා භෞතික සම්පත අනුගත කර ගැනීම හා ඒවා භාවිතා කිරීමට යොමු කිරීම අභියෝගාත්මක කරුණක් වන අතර මෙම තත්ත්වය යටතේ කාර්යක්ෂම දුම්රිය සේවාවක් ලබා දීමේදී ගැටලුවලට මුහුණ දීමටසිදු වේ.

දුම්රිය සේවාවේ ගුණාත්මක හා විශ්වසනීයත්වය ඉහළ නැංවීම සඳහා 2021 වසරේ ක්‍රියාත්මක කළ හා ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන්

- ඉන්දියානු ණය ආධාර යටතේ දුම්රිය මැදිරි 160 ක් ප්‍රසම්පාදනය කිරීම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරිම.
- දේශිය වශයෙන් මගී මැදිරි නිෂ්පාදනය කිරිම
- වායු සමීකරණය කරන ලද බලවේග කට්ටල 02 ක් ප්‍රසම්පාදනය කිරිම
- මහව සිට ඕමන්තේ දක්වා දුම්රිය මාර්ගය පුනරුත්ථාපනය කිරීම අඛණ්ඩව ක්‍රියාත්මක කිරිම
- කැලණිවැලි දුම්රිය මාර්ගය වැඩිදියුණු කිරිමේ මූලික කටයුතු සිදුකිරිම.
- නව ආරක්ෂිත හරස් මාර්ග 200 ක් ස්ථාපිත කිරීම.
- මගී මැදිරි 200 ක් පුනරුත්ථාපනය කිරීම අවසන් කර එම ව්‍යාපෘතියේම දිගුවක් ලෙස තව මැදිරි 100 ක් පුනරුත්ථාපනය කිරිමේ කටයුතු ආරම්භ කිරිම.
- දුම්රිය සේවයේ කාර්යක්ෂමතාව වර්ධනය කිරිම සඳහා ආයතන සමාලෝචන වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරිම.
- **ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය දායකත්වය යටතේ ක්‍රියාත්මක කරනු ලබන කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය**

